## ශ්‍රී ලංකාවෙන් යෝජනා කරනු ලබන කෙටුම්පත

# ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා රාමු ගිවිසුම

(2016.01.12 දින දක්වා ඇතැම් පාර්ශවකරුවන් දක්වන ලද නිගමන සහ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ, ජාත්‍යන්තර වෙළඳ නියෝජිතායතනයේ (යෝජිත) සමහර සමාජිකයන් පසුකාලීනව කරන ලද නව නිගමන මෙම කෙටුම්පතෙහි නිරූපනය වේ.)

## පූර්විකාව

ඉන්දියානු ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමජවාදී ජනරජය (මෙහි මින්පසු "පාර්ශවකරුවන්" යනුවෙන් හඳුන්වන), ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ අගමැති වරුන් 2015 සැප්තැම්බර් මස නව දිල්ලියේ දී පවත්වන ලද සාර්ථකව අවසන් කරන ලද රැස්වීමේ දී දෙරට අතර ආර්ථික සහයෝගීතාව ගැඹුරු කිරීම උදෙසා වැඩ කිරීමට, වූ එකඟතාවය **සිහිපත් කරමින්;**

දෙරට අතර දීර්ඝකාලීන ද්විපාර්ශ්වීක සබඳතා පිළිබඳ **සටහනක් තබමින්** සහ ඔවුන්ගේ සංවර්ධන ඉලක්ක වලට සුදුසුවන ඔවුන්නොවුන්ගේ ආර්ථික දර්ශණයන් සහ උපාය මාර්ග ශාක්ෂාත්කර ගැනීමේ ඇති අයිතිය සහ ඔවුන්ගේ ජාතික ප්‍රතිපත්ති අරමුණු මුදුන්පත් කර ගැනීමට කටයුතු නියාමනය කිරීමට ඇති අයිතිය **පිළිගනිමින්;**

පාර්ශවයන් අතර දැනට ක්‍රියාත්මකව පවතින නිදහස් වෙළඳ ගිවිසුමේ ක්‍රියාකාරීත්වය සහ ආර්ථික දායකත්වය **පිළිගනිමින්;**

ආර්ථික සහ වෙළඳ කටයුතු තවදුරටත් විවෘත කිරීම, තිරසාර සංවර්ධන අරමුණු වලට අනුකුලව පරිසරය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීමට යොමුවෙමින් ස්වාභාවික සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම පහසුකරනු ඇතැයි සැලකිල්ලට භාජනය කරමින්;

ලෝක වෙළඳ සංවිධානයේ දියුණුවෙමින් පවතින රටවල සාමාජිකයන් වශයෙන් සහ අනිකුත් බහුපාර්ශවීක, ප්‍රාදේශීය සහ ද්විපාර්ශ්වීක ගිවිසුම් සහ එකඟතා සඳහා අදාල පාර්ශවයන්ගේ ඇති යුතුකම්, වගකීම් සහ බැඳීම් යළි **තහවුරු කරමින්;**

2008 සැප්තැම්බර් 16 දින පාර්ශවයන් අතර අත්සන් කල විද්‍යා හා තාක්ෂණ ක්ෂෙත්‍රයේ ගිවිසුම වෙත තවදුරටත් යොමුවෙමින් සහ එකී සහයෝගීතාවය පාර්ශවයන්ගේ ආර්ථිකයන් සංවර්ධනය ප්‍රවර්ධනය කරනු ඇතැයි සෑහීමකට පත් වෙමින්;

අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් දෙපාර්ශවයේ ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් වෙළඳ හා ආයෝජන සඳහා පරිසරය ප්‍රවර්ධනය කිරීමට තාක්ෂණ හා පුහුණු කිරීම් ආදී අනිකුත් කෙෂ්ත්‍රවල සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීමට මෙහි මින්පසු මෙම ගිවිසුම යනුවෙන් සඳහන් වන ඉන්දු -ශ්‍රී ලංකා ආර්ථික සහ සහයෝගිතා රාමු ගිවිසුම අත්සන් කිරීම මගින් සහ පාර්ශවයන්ගේ ආර්ථික සමෘද්ධිය හා සංවර්ධනය සහයෝගිතා ක්‍රමවේදයන් සංස්ථාපනය කිරීමටත්

උපදේශනය මගින් පහත පරිදි එකඟ වේ

## 1 වන පරිච්ඡේදය

## පොදු මූලධර්ම

වගන්තිය : 1 අරමුණු

මෙම ගිවිසුමේ අරමුණු :

(අ) පාර්ශවයන් අතර ආර්ථික, වෙළෙඳ හා ආයෝජන සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සහ ඉදිරියට ගෙනයාමටත්

(ආ) පහත මූලධර්ම සැලකිල්ලට ගනිමින් පාර්ශවයන් අතර ආර්ථික හවුල්කාරත්වය සහ ආයෝජන වැඩි දියුණු කිරීමෙන් භාණ්ඩ හා සේවාවන්හි වෙළඳාම තවදුරටත් නිදහස් කිරීම ප්‍රවර්ධනය කිරීමටත්

දෙපාර්ෂවයේ ආර්ථිකයන් හී ඇති අසමමිතිය සලකා පරස්පරතාවය, විශේෂත්වය හා වෙනස් ආකාරයකට සැලකීම සහ වැඩිදියුණු කළ, විනවිදභාවයෙන් යුත් හා පහසුකරණය කරන ලද වෙළඳාම, ආයෝජන සහ ආයෝජන ආරක්ෂණ යාන්ත්‍රණ ක්‍රමාණුකූලව ස්ථාපනය කිරීම සහ ි සහ ා කිරීමේ මෙවලම් ක්‍රමිකව ස්ථාපනය කිරීමටත්

(ඇ) පාර්ශවයන් අතර විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාවය සහ පුහුණු කිරීම් සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීමටත්

(ඈ) මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා උචිත සහයෝගීතා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමටත්

පාර්ශවයන් එකග වේ

## 2 වන පරිච්ඡේදය

## මුල් එළඳාව

**වගන්තිය 1 : භාණ්ඩ වෙළෙඳාමේ මුල් එලදාව**

1. මෙම ගිවිසුමේ අරමුණු සාක්ෂාත් කරගැනීම කඩිනම් කිරීමේ අටියෙන්, පහත සඳහන් කරනු ලබන ක්ෂේතවල මුල්එළදා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශවය එකඟ වී ඇත.

(අ) අනුකූලතා තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටිය අනෝන්‍යව පිළිගැනීමත්,

(ආ) භාණ්ඩ සඳහා විශේෂිත රීති සම්පාදනය කිරීමත්,

(ඇ) දැනට ක්‍රියාත්මක වන නිදහස් වෙළඳ ගිවිසුමේ පවතින ප්‍රමාණාත්මක සීමා ඉවත් කිරීමත්.

(ඈ) වෙළඳාම පහසුකරණය සඳහා කේන්ද්‍රීය ස්ථානයක් ස්ථාපිත කිරීමත්.

2. රටවල් දෙකෙහි ව්‍යවසායකවන් හට මෙම යෝජිත ගිවිසුමෙන් කඩිනමින් ප්‍රතිලාභ ලබා ගැනීම පහසුකිරීම සහ මේ පිළිබඳව කෙරෙන ඉදිරි සාකච්ඡාවලදී රාජ්‍යයන් දෙකෙහිම විශ්වාසනීයත්වය වර්ධනය කිරීම සඳහා මෙකි වැඩසහන හැකිතාක් ඉක්මනින් කිරීමටත්

ඉදිරි සාකච්ඡාවලට ප්‍රථම දෙරටේ හැකියාව අභිමුඛව සිටින ව්‍යවසාකයන්ට පහසුකම් සැලසීමේ අරමුණින්' යෝජිත සවිස්තිරණ ගිවිසුම මූලාරම්භයේම වාසිඅත්කර දීමට සහ අතර විශ්වසනත්වය නන්වා ලීම සඳහා ක්‍රියාත්මක කිරීමටත්,

3. අදාල මට්ටම්වල ක්‍රියාකාරි කණ්ඩායමක් හෝ උප කණ්ඩායමක් ස්ථාපනය කිරීම මගින් මෙම භාණ්ඩ වෙළෙඳාම සම්බන්ධයෙන් වු මුල්එළදා වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත්,

## 3 වන පරිච්ඡේදය

## වෙළෙඳාම සහ ආයෝජනය

### වගන්තිය 1 : භාණ්ඩ වෙළෙඳාම

1. මෙම ගිවිසුම බලාත්මක වීමෙන් අනතුරුව භාණ්ඩ වෙළෙඳාම පිළිබඳ එකඟතාවයන් අනුව ද්විපාර්ශ්වීක උපදේශනයන් ආර්ම්භ කිරීමට දෙපාර්ශවය එකගවී ඇති අතර එම උපදේශනයන් හැකිතාක් ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

2. භාණ්ඩ වෙළෙඳාම සඳහා වන එකඟතාවයන්ට පහත සඳහන් ද ඇතුලත් වන අතර එහෙත් ඒවාට පමණක් සීමානොවනු ඇත.

(අ) පාර්ශවය අතර දැනට පවතින නිදහස් වෙළඳ ගිවිසුමේ (ISFTA) ඇතුලත් වන තීරුබඳු අඩුකිරීම සඳහා පියවරයන් හෝ සෘණාත්මක ලැයිස්තුවේ ඇතුලත් වන අයිතමයන් ඉවත් කිරීම හෝ ආන්තිකවරණය (MoP) හෝ පංගු.

(ආ) ව්‍යුත්පන්න රීති

(ඇ) රේගු පටිපාටිය

(ඈ) තීරු බඳු නොවන ක්‍රියාමාර්ග, වෙළෙඳාම සඳහා වූ තාක්ෂණික බාධක (TBT) සහ සනීපාරක්ෂක සහ සුවතා ක්‍රියාමාර්ග ඇතුලත්ව නමුත් එපමකට සීමා නොවී.

(ඈ) 1994 තීරු බඳු සහ වෙළෙඳාම සඳහා වූ පොදු එකඟතාවයෙහි මාතෘකාව 6 ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාමාර්ග ඇතුලුව වෙළඳ අවහිරතා ඉවත් කිරීම සඳහා වන ක්‍රියාමාර්ග, සහන සහ ක්‍රියාමාර්ග සහ ලෝක වෙළෙඳ සංවිධානයේ ආරක්ෂක නියාමක ගිවිසුම සහ භාණ්ඩ පිළිබඳ වෙළෙඳාමට අදාල වන පාර්ශවයන් අතර දෙපාර්ශවය අතර ආරක්ෂක නියාමක ක්‍රියාමාර්ග

3. භාණ්ඩ වෙළෙඳාම මත වන ගිවිසුමෙහි අඩංගු තීරු බඳු සහන මත පදනම්ව ඕනෑම පාර්ශවයක් විසින් සිය අභිමතය පරිදි තීරු බදු අවම කිරීම කඩිනම් කල හැක

### වගන්තිය 2 - සේවා වෙළෙඳාම

1. මෙම ගිවිසුම බලාත්මක වීමෙන් පසු සේවා වෙළෙඳාම වෙනුවෙන් වන එකඟතාවය මත ද්විපාර්ශවීක සාකච්ඡා ඇරඹීමට දෙපාර්ශවය එකග වී ඇති අතර, එවැනි සාකච්ඡා හැකිතාක් ඉක්මනින් නිමා කිරීමට ද ක්‍රියා කරනු ඇත.

2. සේවා වෙළෙඳාම් එකඟතාවයන් ද අදාල සාකච්ඡා පහත සඳහන් කරුණු කෙරෙහි යොමු කෙරේ.

(අ) දෙපාර්ශවය අතර සේවා වෙළඳාම නිදහස්කරණය සඳහා වන සාකච්ඡා හා සම්මුතීන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ක්ෂේත්‍රයන් සඳහා සිදු කෙරේ.

සෑම අවස්ථාවකම එකී ක්‍රියාමාර්ග එක් එක් පාර්ශයන්ට අදාල ආර්ථික තත්ත්වයන්, සංවර්ධනය, වෙළෙඳාම, ආයෝජනය සහ මූල්‍ය අවශ්‍යතාවලට අනුරූපව සිදු කෙරේ.

(ආ) පාර්ශව අතර අනෝන්‍ය වශයෙන් එකඟ වූ ක්ෂේත්‍රයන්හි සේවා වෙළඳාමේ සහයෝගිතාව වැඩිදියුණු කිරීම.

වගන්තිය 3 : ආයෝජන (භාණ්ඩ හා සේවා)

1. මෙම ගිවිසුම බලාත්මක කිරීමෙන් පසු මෙම වගන්තියේ දෙවන ඡේදයෙහි සඳහන් වන කරුණු වලට අදාලව ද්වීපාර්ශවීක සාකච්ඡා ඇරඹීමට දෙපාර්ශවය එකඟවී ඇති අතර එවැනි සාකච්ඡා දැනට ක්‍රියාත්මක වන ද්වීපාර්ශ්වීක ආයෝජන ප්‍රවර්ධන සහ ආරක්ෂණ ගිවිසුම පුළුල් කිරීමට අත්‍යන්තයෙන් යොමුවෙමින් හැකිතාක් ඉක්මනින් අවසන් නිමා කිරීමට **දෙපාර්ශවය** එකඟ වී වි ඇත.

2. පහත සඳහන් ද එහෙත් එපමනකට සීමා නොවී, එවැනි එකඟතාවයක ඇතුළත් වේ.

(අ) ආයෝජන ආරක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

(ආ) ආයෝජන වලට අදාල රෙගුලාසි වල විනිවිද භාවය වැඩි කිරීම.

(ඇ) දෙපාර්ශවය අතර ආයෝජනවල සීමාවන් ක්‍රමයෙන් අඩු කිරීම.

(ඈ) ආයෝජන සඳහා පහසුකරණය ප්‍රවර්ධනය කිරීම.

## 4 වන පරිච්ජේදය

## ආර්ථික සහයෝගීතාවය

**වගන්තිය 1 : අරමුණු**

පාර්ශවයන් පහත සඳහන් දට යොමුවේ.

(අ) අන්නෝනය වාසි පදනම් කරගෙන ඔවුන් අතර අර්ථික සහයෝගිතාවය ශක්තිමත් කිරීමට හා වැඩි දියුණු දියුණු කිරීමට.

(ආ) දෙරට අතර සමීප ආර්ථික සහයෝගිතාවයක් ඇතිකර ලීමටත් ඒ සඳහා නව මං පෙත් සොයා බැලිමටත් වඩා සුදුසු ක්‍රියා මාර්ග සංවර්ධනය කිරීමටත් එතුලින් මහා ආර්ථික ඒකාබද්ධතාවයක් ඇති කිරීමටත්,

සහ

(ඇ) එකිනෙකාගේ සංවර්ධන අවශ්‍යතා සහ ඔවුන්ට අදාල ජනතාවගේ සුබසාධනය ඇති කිරීමට අනුගතව ආර්ථික සහයෝගීතාවය වෙනුවෙන් උදව් කිරීම සහ ඔසවා තැබීම.

**වගන්තිය 2 : සහයෝගිතා තරම**

1. මෙම ගිවිසුමේ ප්‍රතිලාභ වැඩි දියුනු කිරීමට හා පුළුල් කිරීමට, පහත සඳහන් ද එහෙත් එපමනකට සීමා නොවී සහයෝගිතාවය ශක්තිමත් කිරීමට පාර්ශවයන් එකග වී ඇත.

(අ) බුද්ධිමය දේපළ පිළිබඳ අයිතිය ආරක්ෂා කිරීම.

(ආ) මූල්‍යමය කාරණා.

(ඇ) වෙළෙඳාම ප්‍රවර්ධනය හා පහසු කරලීම.

(ඈ) සංචාරක කර්මාණ්තය.

(ඉ) රේගුව.

(ඊ) ඊ-වාණිජ.

(උ) කර්මාණ්ත.

(ඌ) කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවාසකයන් ප්‍රවර්ධනය කිරීම හා ඒවායේ තරඟකාරීත්ය වැඩි දියුණු කිරීම.

2. මෙම ගිවිසුම බලාත්මක කිරීමෙන් පසුව මෙම මාතෘකාවේ සඳහන් කරුණු විශේෂ වැඩසටහන් සහ අන්තර්ගතය පිළිබඳව හැකි ඉක්මනින් උපදේශණයන් පවත්වනු ඇත.

## 5 වන පරිච්ඡේදය

## තාක්ෂණික සහයෝගිතාවය

වගන්තිය 1 ඃ අරමුණු

සමානත්වය හා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පදනම් කරගෙන විද්‍යාව සහ තාක්ෂණ සහයෝගිතාව ශක්තිමත් කිරීමට හා වැඩිදියුණු කිරීමට දෙපාර්ශවය යොමුවේ.

වගන්තිය 2 ඃ සහයෝගිතා විධි

1. පහත සඳහන් දෑ හේතුකොට ගෙන පාර්ශයන් සාමුහික ක්‍රියාකාරකම් දිරිගන්වනු ඇත.

(අ) පර්යේශන මත පදනම් වූ නව්‍යථා ක්‍රියාවලි සහ තාක්ෂණයන් නියමු හා වාණිජ අලෙවිය සඳහා නංවා තබනු ඇත.

(ආ) අධිතාක්ෂණ නිපැයුම්, තාක්ෂණ හුවමාරු සහ වාණිජ කරනය සඳහා දැඩි අවධානයක් යොමුකරවන ලෙසට පර්යේෂණ ආයතන දිරිගන්වනු ඇත.

(ඇ) ව්‍යවසාකත්වය පහසුකරලීම සහ විද්‍යාඥයන්, තාක්ෂණිකයන්, පර්යේෂකයන් සහ නව නිපයුම් කරුවන් අතර ක්‍රියාකාරකම්.

(ඈ) ජාතික සහ ජාත්‍යන්තර පිළිගැනීම තහවුරු කිරීම සඳහා ආයතන වල, භාණ්ඩ හා සේවාවල ගුණාත්මක තත්ත්වයන් තහවුරු කිරීම.

2. විද්‍යා හා තාක්ෂණ ක්ෂෙත්‍ර වලට අදාලව 2008 සැත්තැම්බර මස 16 වන දින දෙරට අතර අත්සන් කළ ගිවිසුම මඟින් දෙපාර්ශවය ක්‍රියාත්මක කරනු ඇත.

3. අගතියෙන් තොරයි

## 6 වන පරිච්ඡේදය

## පුහුණු

**වගන්තිය 1 ඃ අරමුණු**

දෙරටේ ආර්ථිකය උසස් කිරීම සඳහා ශක්තිමත් මානව සම්පත් මූලයක් තිබීම වැදගත් බව පිළිගනිමින් අධ්‍යාපන වෘත්තිය පුහුණු සහ නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රයන්හි සහයෝගිතාවය දෙපාර්ශවය එකඟ වේ.

**වගන්තිය 2 ඃ සහයෝගිතා විධි**

අධ්‍යාපන, වෘත්තිය පුහුණු සහ නිපුනතා සංවර්ධන ක්ෂේත්‍රයන්හි ද්වීපාර්ශවීක සහයෝගිතාවය ශක්තිමත් කිරීම සඳහා සුවිශේෂ වූ මං පෙත් උකහා ගැනීමට දෙපාර්ශවය එකඟ වේ.

## 7 වන පරිච්ඡේදය

## අතිකූත් ප්‍රතිපාදන

**වගන්තිය i ඃ නිදහස් කිරීම්**

දෙපාර්ශවය පාර්ශව කරුවන් වන ලෝක වෙළෙඳ සංවිධානයෙහි සහ අනිකුත් ගිවිසුම් වල නිදහස් වීමේ ක්‍රියාමාර්ග වල වැලකි සිටීමට මෙම ගිවිසුමේ අර්ථකතනයන් ඉඩ සලසා නැත.

**වගන්තිය ii ඃ ආරාවුල් සමතයකට පත්කිරීම**

1. මෙම ගිවිසුම බලාත්මක කිරීමෙන් මාස 6 කට නොඅඩු කාලයකදි මෙම ගිවිසුම අර්ථකතනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ භාවිතා කිරීමේ දී ඇතිවිය හැකි ආරවුල් නිරවුල් කිරීම සඳහා පාර්ශයන් උපදේශණයන්ට යොමුවිය යුතුය. සහ හැකිතාක් ඉක්මනින් එවැනි පටිපාටි පිළිබඳ එකඟතාවයකට එළඹිය යුතුය.

2. මෙම මාතෘකාවේ පලමු ඡේදයේ සඳහන්වන පරිදි පටිපාටි ස්ථාපනය කිරීමට පෙර අර්ථකතනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ භාවිතය සම්බන්ධයෙන් කිසියම් ආරවුලක් පැන නැගුනහොත් පාර්ශයන් අතර උපදේශණය මගින් හෝ යෝග්‍ය ආකාරයකින් ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික හ තාක්ෂණික සහයෝගිතා රාමු ගිවිසුමේ මාතෘකාව 6 (iii) පරිදි පිහිටුවීමට යෝජිත කමිටුව විසින් හෝ විසඳිය යුතුය.

**වගන්තිය iii ඃ ආයතනික සැකැස්ම**

1. ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා රාමු ගිවිසුම කමිටුව දෙපාර්ශවය විසින් ස්ථාපනය කළ යුතුය. (මෙහි මින් පසු කමිටුව යනුවෙන් හඳුන්වන)

එකී කමිටුව දෙපාර්ශවය විසින් නම් කරණු ලබන නියෝජිතයන්ගෙන් සැඳුම් ලත් වේ. ගිවිසුමට අදාල පහත සඳහන් කරුණු කාරනා, එහෙත් ඊට සීමා නොවු, ක්‍රියාත්මත කිරීමේ වගකීම කමිටුවට පැවරේ;

(අ) මෙම ගිවිසුමේ සඳහන් වන අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය උපදේශණයන් නිමා කිරීම;

(ආ) මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම්;

(ඇ)(ඈ) වැදගත් ආර්ථික සහ වෙළඳ තොරතුරු හුවමාරු කරගැනීම.

(ඉ) මෙම පරිච්ඡේදයෙහි මාතෘකා (ii) හි සඳහන්වන පරිදි අර්ථකතනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ භාවිතය පිළිබඳව ඇතවන ඕනෑම ආරවුලක් සමතයට පත්කිරීම.

2. කමිටුව, කමිටුවේ අධීක්ෂණයට යටත්ව විශේෂිතවූ ක්ෂත්‍රවලට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන පරිදි ක්‍රියාකාරි කමිටු/ව පත් කළ හැක.

3. අඛණ්ඩ පදනම මත වාර්ෂික රැස්වීම් පැවැත්වීමට හා අවශ්‍ය යයි හැඟෙන අවස්ථාවලදි රැස්වීම/ම් දෙපාර්ශවයේ කැමැත්ත මත පැවත්වීම කමිටුවට කළ හැක.

4. පාර්ශවයන් විසින් පත්කරනු ලබන නිසි බලධාරින් විසින් තොරතුරු ලබා දීම සඳහා නම් කරනු ලබන තැනැත්තන් විසින් මෙම ගිවිසුමට අදාල කරුණු සන්නිවේදනය කළ හැක.

**වගන්තිය iv තොරතුරු සටහන් කිරීමේ ආකෘතිය**

මෙම ගිවිසුමෙන් පැන නගින කරුණු සන්නිවේදනය කිරීම සඳහා පාර්ශවයන් එකඟ වූ තොරතුරු සටහන් කිරීමේ ආකෘති යොදාගත යුතුය.

**වගන්තිය v ඇමුණුම් පසුව එලඹෙන ගිවිසුම්**

මෙම ගිවිසුමට අනුව සියළු පසුව එළඹෙන ගිවිසුම් මෙම ගිවිසුමේ කොටස් බවට පත්වේ.

**වගන්තිය vi සංශෝධන**

මෙම ගිවිසුමට කරනු ලබන ඕනෑම සංශෝධනයක් පාර්ශව අතර අන්‍යෝන්‍ය කැමැත්ත ලිඛිතව ප්‍රකාශ කිරීමට යටත්ව සිදුවිය යුතුය. එවැනි සංශෝධන මෙම ගිවිසුමේ මාතෘකාව vii අනුව බලාත්මක වේ.

**වගන්තිය vii බලාත්මක කිරීම**

මෙම ගිවිසුමට නිත්‍යානුකූලව එළඹුනු පසුව පාර්ශවයන් අදාල අභ්‍යන්තර ක්‍රියා පටිපාටි ලිඛිතව ඔවුනොවුන්ට දැන්විය යුතුය. අභ්‍යන්තර ක්‍රියාමාර්ග වලට අදාල අවසාන දැනුම් දීම සිදු කළ දිනයේදී මෙම ගිවිසුම බලාත්මක වේ.

**වගන්තිය viii අවසාන කිරීම**

1.කිසියම් පාර්ශවයකට මෙම ගිවිසුම අවසාන කරීමට අවශ්‍ය නම් එකි කැමැත්ත ලිඛිතව අනික් පාර්ශවයට දැනුම් දිය යුතුය. එවැනි දැන්වීමක් තැබීමෙන් පසු දින 30 ක් ඇතුතලත දී උපදේශනයන් ආරම්භ කල යුතු අතර දෙපාර්ශවය අතර පැන නැගි ඇති කරුණු සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹීමට යොමුවිය යුතුය. දින 180 ක් ඇතුලත උපදේශනයන් මගින් එකඟතාවයකට එළඹීමට නොහැකිවනවා නම් අවසාන කිරීමට ඇති අභිලාශය ඇතවේ.

2.අවසාන කිරීමේ නිවේදනය නිකුත්කර දින 30ක් ඇතුලත පාර්ශවයන් අන්‍යෝන්‍ය උපදේශනය මගින් ගිවිසුම අවසන් කිරීම හේතුකොට ගෙන පැන නගින කාරනා පාර්ශයන් විසින් කර ගත යුතුය.

මෙම ගිවිසුම පිටපත් හතරකින් ඉංග්‍රීසි භාෂාවෙන් 20..... වර්ෂයේ....... මාසයේ ...... දින අත්සන් කරනු ලබන අතර සියලු පිටපත් සමනව බලගැන්වෙන අතර සෑම පාර්ශවයක්ම පිටපත් දෙකක් තබාගනු ඇත.